# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2039/7 - 2017 ඔක්තෝබර් මස 03 වැනි අඟහරුවාදා - 2017.10.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

එල්. ඩී. බී. 94/47 - V

**(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත**
**6(2)(ආ) සහ 21(2)(ආ) වගන්ති යටතේ වූ නියමය**

(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 6(2)(ආ) සහ 21(2)(ආ) වගන්ති මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මා විසින්, මේ නියෝගය මගින්,

(1) ඉහත කී ආඥා පනතේ කාර්යය සඳහා මෙහි උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන, "ගනේමුල්ල තිබ්බොටුගොඩ පුරාණ ශ්‍රී සුගතාරාම රජමහා විහාර භූමි ප්‍රදේශය" යනුවෙන් හඳුන්වනු ලබන භූමි ප්‍රදේශය නාගරික සංවර්ධන ප්‍රදේශයක් බවට ප්‍රකාශයට පත් කරනු ලැබේ; සහ

(2) නාගරික සංවර්ධන ප්‍රදේශයක් බවට ප්‍රකාශයට පත් කරනු ලැබූ "ගනේමුල්ල තිබ්බොටුගොඩ පුරාණ ශ්‍රී සුගතාරාම රජමහා විහාර භූමි ප්‍රදේශය" සම්බන්ධයෙන් පරිබාහිර සැලැස්මක් සකස් කළ යුතු බවට විධානය කරනු ලැබේ.

**පාඨලී චම්පික රණවක,**
මහානගර හා බස්නාහිර
සංවර්ධන අමාත්‍ය.

2017 සැප්තැම්බර් මස 27 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

**ගනේමුල්ල තිබ්බොටුගොඩ පුරාණ ශ්‍රී සුගතාරාම රජමහා විහාර භූමිය සංයුක්ත වන ප්‍රදේශය**

ගම්පහ දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ 2013 අප්‍රේල් මස 01 වන දින අංක ගම්/ගම්/2012/347 දරණ සැලසුමේ නිරූපිත බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රාගම් පත්තුව සුළු කොට්ඨාශයේ, තිබ්බොටුගොඩ ගමේ පිහිටි හෙක්ටයාර් 0.3979ක විශාලත්වයෙන් යුක්ත පහත දැක්වෙන පරිදි මායිම් වූ ප්‍රදේශය :-

මායිම් උපලේඛනය :

උතුරට: එස්. නන්දසේන හිමිකම් කියන ගොඩැල්ලවත්ත, එස්. විජේපාල සිල්වා හිමිකම් කියන ගොඩැල්ලවත්ත, පී. දේවප්‍රිය හිමිකම් කියන නාගහවත්ත, කේ. ඩී. සන්ධ්‍යා හිමිකම් කියන නාගහවත්ත, හිමිකම් කියන්නා සොයාගත නොහැකි නාගහවත්ත, යූ. ඩී. ආර්. මල්කාන්ති හිමිකම් කියන නාගහවත්ත සහ ඒ. අබේරත්න හිමිකම් කියන නාගහවත්ත.

නැගෙනහිරට: පී. දේවප්‍රිය හිමිකම් කියන නාගහවත්ත, කේ. ඩී. සන්ධ්‍යා හිමිකම් කියන නාගහවත්ත, හිමිකම් කියන්නා සොයාගත නොහැකි නාගහවත්ත, යූ. ඩී. ආර්. මල්කාන්ති හිමිකම් කියන නාගහවත්ත, ඒ. අබේරත්න හිමිකම් කියන නාගහවත්ත, එස්. රත්නායක හිමිකම් කියන නාගහවත්ත සහ විහාර මාවත.

දකුණට එස්. රත්නායක හිමිකම් කියන නාගහවත්ත, විහාර මාවත සහ එච්. කුලසේකර සහ ආර්. සී. මාලනී හිමිකම් කියන ගොඩැල්ලවත්ත.

බටහිරට එච්. කුලසේකර සහ ආර්. සී. මාලනී හිමිකම් කියන ගොඩැල්ලවත්ත, එස්. නන්දසේන හිමිකම් කියන ගොඩැල්ලවත්ත සහ එස්. විජේපාල සිල්වා හිමිකම් කියන ගොඩැල්ලවත්ත.

10 - 549

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.